මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

1 වන මහල, සෙත්සිරිපාය අදියර II, බත්තරමුල්ල. 1 ஆவது மாடி, செத்சிறிபாய கட்டம் II, பத்தரமுல்லை. 1st Floor, Sethsiripaya Stage II, Battaramulla.

අමාත්‍යාංශ කාර්යාලය / அமைச்சு அலுவலகம் / Minister General Office : 011 - 2887 349, 011 - 2887 350
ෆැක්ස් / பெக்ஸ் / Fax : 011 - 2884 613
වෙබ් අඩවිය / இணையத்தளம் / Website : www.socialemwelfare.gov.lk

මගේ අංකය / எனது இல / My No. :
ඔබේ අංකය / உமது இல / Your No. :
දිනය / திகதி / Date : 2020 – 12 - 16

## ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සමාජ ආරක්ෂණ වැඩසටහන් සම්බන්ධයෙන් අමෙරිකානු රජයේ ප්‍රසාදය

ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපතිනි ඇලයිනා බී. ටෙප්ලිට්ස්, දේශපාලන නිලධාරී ජෙෆ්රි වැනින් යන මහත්ම මහත්මීන් සහ සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මහතා අතර හමුවක් ඊයේ (15) පැවැත්විණි.

බත්තරමුල්ලේ පිහිටි රාජ්‍ය අමාත්‍ය කාර්යාලයේ දී පැවැති මෙම හමුවේ දී මූලික අවධානය යොමුවූයේ සමාජ සවිබලගැන්වීමේ වැඩසටහන්, අඩු ආදායම්ලාභී ජනතාව සඳහා නව ආදායම් උත්පාදන අවස්ථා ඇතිකිරීම හා ක්ෂුද්‍රමූල්‍ය අංශය පිළිබඳව නව කතිකාවක් ඇති කිරීම සම්බන්ධවයි.

වත්මන් රජයේ සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළ හා එහි ප්‍රතිපත්ති සම්බන්ධයෙන් තමා සතුටට පත් වන බවත්, ඒ සඳහා ඕනෑම අවස්ථාවක අවශ්‍ය සහය ලබාදීමට ඇමරිකානු රජය සූදානම් බවත් තානාපතිනිය සඳහන් කළාය.

බොහෝ කුසලතාවන්ගෙන් පිරිපුන් ශ්‍රී ලාංකිකයන්ගේ සන්නිවේදන දුර්වලතා හේතුවෙන් ගෝලීය ආර්ථිකය හමුවේ යම් පසුබෑමකට ලක්ව ඇති බව පෙන්වා දුන් ඔවුන් එම පසුබෑම අවම කිරීම සඳහා සන්නිවේදන කුසලතා දියුණු කිරීමේ වැඩසටහන්වලට උපදේශනය සැපයීමට ඔවුන් ඉතා කැමැත්තෙන් සිටින බව වැඩිදුරටත් දැන්වීය.

මාධ්‍ය ඒකකය,
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය,
ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.